# Sri Lanka Police Recruitment

## මාර්ගගත අයදුම්පත / விண்ணப்பம் / Online Application

### අයදුම් කිරීම සඳහා උපදෙස්

**<u>අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පහත උපදෙස් හොඳින් කියවා උඩුගත කල යුතු ලේඛන සූදානම් කර තබා ගන්න</u>**

- අයදුම් කරන තනතුර ගැසට්පත්‍රයේ සඳහන් කර ඇති සුදුසුකම් අනුව තෝරා ගන්න.
- එක් අයදුම්කරුවෙකුට එකම තනතුරක් සඳහා දෙවරක් අයදුම්කළ නොහැක. නමුත්, සාමාන්‍ය පොලිස් සේවයේ තනතුරු හා විශේෂ කාර්ය බළකායේ තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ හැකිය.
- අයදුම්පතෙහි සඳහන් සියලු තොරතුරු නිවැරදිව පිරවිය යුතුය. අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීමෙන් අයදුම්පත නිශ්ප්‍රභා විය හැක.
- අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී ඇතිවිය හැකි දෝෂ හා වැඩිදුර උපදෙස් සඳහා පොලිස් ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසයේ පහත දුරකථන අංක මගින් විමසීම් කල හැකිය.

| | |
|---|---|
| සහකාර පොලිස් අධිකාරී (බඳවා ගැනීම්) | - 0718591924 |
| ස්ථානාධිපති (බඳවාගැනීම්) | - 0718591925 |
| කාර්යාලය | - 011-2552736 |

**<u>අයදුම්පත සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු හා උඩුගතකල යුතු ලේඛන</u>**

- අයදුම්කරුගේ උස හා පපුව (අඩි, අඟල් හා සෙන්ටිමීටර් වශයෙන්) මැන සටහන් තබා ගන්න.
- දෙමාපියන්ගේ හා සහෝදර සහෝදරියන්ගේ නම්, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක, දුරකථන අංක හා පදිංචි පොලිස් වසම් පිළිබඳ තොරතුරු තබා ගන්න.
- විද්‍යුත් තැපැල් ලිපිනය, වට්ස්ඇප් අංකය (WhatsApp), මුහුණුපොත (Face Book) නාමය නිවැරදිව ඇතුලත් කිරීම සඳහා URL (link) භාවිතා කරන්න.

**<u>උඩුගතකල යුතු ලේඛන</u>**
(සියලු ලිපි ලේඛන 1MB ප්‍රමාණයට නොවැඩි විය යුතුය. (PDF/JPG))

(ඡායාරූපය පමණක් (JPG) ඇතුළත් කළ යුතුය.)

- සුදු පැහැති පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපය (අනිවාර්යය)
- උප්පැන්න සහතිකය (අනිවාර්යය)
- ජාතික හැඳුනුම්පත (අනිවාර්යය)
- අධ්‍යාපන සහතික - (ඉල්ලුම් කරන තනතුරේ සුදුසුකම්වලට අදාල අධ්‍යාපන සහතික පිටපත් අනිවාර්ය වේ)
- වලංගු රියදුරු බලපත්‍රය (පොලිස් කොස්තාපල් රියදුරු අයදුම්කරුවන් සඳහා අනිවාර්යය)
- ගැසට්පත්‍රයේ අනු අංක 18 හි පරිදි රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (පොලිස් සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් අදාල කොට්ඨාසභාර නිලධාරී/ අධ්‍යක්ෂගේ නිර්දේශය අනිවාර්ය වේ.)
- ඔබ රාජ්‍ය සේවයේ/ ත්‍රිවිධ හමුදාවේ හෝ වෙනත් සන්නද්ධ සේවයේ සිට ඉවත් වී ඇත්නම් අස්වීමේ ලිපිය.

**<u>සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී රැගෙන ආ යුතු ලේඛන</u>**

- ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත. එහි ඔබගේ අත්සන හා දිනය යොදන්න.
- උඩු ගත කරන ලද ඡායා රූපය හා සියළුම ලේඛනවල ඡායා පිටපත බැගින් රැගෙන එන්න.